## ලංසු සඳහා ආරාධනාවයි
## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

1. මහනුවර දිස්ත්‍රිකයේ තෝරාගත් පාසල්වල ක්‍රීඩාපිටි සංවර්ධනය ඉදිකිරීම හා සඳහා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සුදුසුකම්ලත් අසාධු ලේඛනගත නොවූ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු ආරාධනා කරනු ලැබේ.

2. ලංසුකරුවන් තෝරා ගැනීමේදී මීට පෙර කර ඇති සාර්ථක ඉදිකිරීම් පිළිබඳව සැලකිල්ලට ගන්නා අතර ඒ පිළිබඳ විස්තර ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.ලංසුවට අදාල වැඩිමනත් විස්තර මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දුරකථන අංක 081-2233604 න් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි අමතා ලබාගත හැකිය.

3. ලංසු විස්තර www.Kandy.dist.gov.lk වෙබ් අඩවියේ "ප්‍රසම්පාදන" තීරුව මගින් තොරතුරු ලබාගත හැකි අතර ලංසු ලියවිලි සඳහා 2024.10.15 දින ප.ව.3 .00 දක්වා ගාස්තුව මුදලින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය.

4. ලංසු ලියවිලිවල ඉල්ලා ඇති තාක්ෂණික මුලා හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛනවල සහතික කළ පිටපත් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

5. නිසි පරිදි සම්පූරණ කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයක බහා 2024.10.16 දින පෙ.ව.10.00 හෝ ඊට පෙර ලැබෙන සේ මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ,මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහල වම් කෙලවර අදාල ලංසුවේ නම සඳහන් කළ යුතුය.

6. ප්‍රමාද වී ලැබෙන සහ නියමිත උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබාගත් පහත වගුවේ සඳහන් වටිනාකමින් හා ලංසු විවෘත කරන දින සිට වලංගු දින ගණනින් යුතු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණ " මහනුවර දිස්ත්‍රික් ලේකම් " නමින් ලබාගෙන තැන්පත් කර තිබීම අත්‍යාවශයවේ.

උපලේඛනයේ

| අනු අංකය | කර්මාන්තය | මුළුපිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන (වැට් රහිතව) | අවශ්‍ය අවම CIDA ලියාපදංචිය | ලංසු සුරක්ෂණයේ වටිනාකම ආපසු ගෙවන | | ලංසු සුරක්ෂණය සඳහා දින ගණන | ලංසු ලියවිලි ගාස්තුව ආපසු නොගෙවන |
|---|---|---|---|---|---|---|---|
| | | | | බැංකු සහතිකය | මුදලින් | | |
| | | | | රුපියල් | රුපියල් | | |
| 01 | කාලාප A පාසල් 7ක ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම. | 8.5 | C 7 , C6 | 85,500.00 | 42,750.00 | 91 | 2,500.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 02 | කාලාප B පාසල් 6ක ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම. | 7.2 | C 7 , C6 | 72,500.00 | 36,300.00 | 91 | 2,000.00 |
| 03 | පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කඩදාසි එකතු කිරීම ,තොග ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | 6.6 | C 7 , C6 | 64,500.00 | 32,300.00 | 91 | 1,900.00 |

8.ලංසු භාර ගන්නා වේලාව පසු වූ වහාම විවෘත කරනු ලැබේ.එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පැමිණ සහභාගි විය හැකිය.

09.ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනීම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසුව ප්‍රතික්ෂේප කිරීමෙ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර,ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසන් තිරණය වේ.

චන්දන තෙන්නකෝන්
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ,
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මහනුවර

චන්දන තෙන්නකෝන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම් මහනුවර
සහ
අතිරේක ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය